# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2446/02 - 2025 ජූලි මස 21 වැනි සඳුදා - 2025.07.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: DS/VN/L.ACQ/SCH-04.
*කෘෂිකර්ම පශු සම්පත් වාරිමාර්ග සහ ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/13/2021/PC/255.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :-

කැඩැස්තර සිතියම් අංකය: 910251හි කලාප අංකය 01 පත්‍ර අංකය 1

පළාත: උතුර
දිස්ත්‍රික්කය: යාපනය
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: වලිකාමම් උතුර, තෙල්ලිප්පළේ
ග්‍රාම නිලධාරි කොට්ඨාසය: තන්තයිසෙල්වාපුරම් (J/230)
ගම: තෙල්ලිපළේ නැගෙනහිර
හේතුව: යා/මහජන විද්‍යාලයේ පාසල් ක්‍රීඩාපිටිය සහ නව පංති කාමර ඉදිකිරීම සඳහා - තෙල්ලිප්පළේ

කැබලි අංක 1
ඉඩමේ නම: තෝත්තරයි; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අ.මාදිනි; ප්‍රමාණය: හෙක්. 0.0418.

කැබලි අංක 2
ඉඩමේ නම: තෝත්තරයි; විස්තරය: වත්ත, අවුරුදු 5-7ක වයසැති පොල් ගස් දෙකක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අ.කනකේස්වරි; ප්‍රමාණය: හෙක්. 0.0122.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025.10.01 වැනි දින පෙ.ව. 9.30 ට තෙල්ලිප්පළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය. තව ද, 2025.09.24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ තොරතුරු, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**එස්. සුතීස්නර්,**
ප්‍රාදේශීය ලේකම්,
තෙල්ලිප්පළේ.

2025 ජූලි මස 14 වැනි දින,
වලිකාමම් උතුර, තෙල්ලිප්පළේ
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0239




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය:-* ශ්‍රීජපුර/ඉඅ/64/අතිරේක (02).
*ඉඩම් අමාත්‍යාංශයේ ගොනු අංකය* : 4-3/6/2017/HW/494.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශ්‍යතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 514B රාජගිරිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙහි වැලිකඩ (ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ)ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙළ කරන ලද කැඩැස්තර සිතියම් අංක 521618 හා 2023.07.07 දිනැති පිඹුරෙහි ප්‍රමාණයෙන් හෙක්. 0.0021 ක් වූ කැබලි අංක 01 දරන ඉඩම

**කැබලි අංක 01**

ඉඩමේ නම: සොයාගත නොහැක; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: අංක 93 බුත්ගමුව පාර රාජගිරිය ලිපිනයේ පදිංචි එස්.ඒ.ටී.ඩී පෙරේරා, කොල්ලුපිටිය - ශ්‍රී ජයවර්ධනපුර මාර්ගය, වැලිකඩ - නාවල මාර්ගය සහ වැලිකඩ-රාජගිරිය මාර්ගය පුළුල් කිරීම සඳහා අවශ්‍ය වී ඇත; ප්‍රමාණය හෙක්. 0.0021

ඉහත සඳහන් ඉඩමට /පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 ඔක්තෝබර් මස 16 දින පෙ.ව. 10.00 ට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2025 සැප්තැම්බර් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම /ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**කසුන් ඇපා සෙනෙවිරත්න,**
ප්‍රාදේශීය ලේකම්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

2025 ජූලි මස 18 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

EOG 07 - 0257

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය:-* ශ්‍රීජපුර/ඉඅ/73/NWSD.
*ඉඩම් අමාත්‍යාංශයේ ගොනු අංකය* : 4-3/9/2017/WS/42.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 514 A වැලිකඩ බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙ හි වැලිකඩ (ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගරසභා සීමාව තුළ) පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙළ කරන ලද කැඩැස්තර සිතියම් අංක 521602 හා 2023.08.31 දිනැති පිඹුරෙහි ප්‍රමාණයෙන් හෙක්. 0.0198 ක් වූ කැබලි අංක 01 දරන ඉඩම.

**කැබලි අංක 01**

ඉඩමේ නම: සොයාගත නොහැක; ඉඩමේ විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: අංක 225, රාජගිරිය පාර රාජගිරිය සීතා පෙරේරා සහ ජේ. ඒ. ආරියරත්න පෙරේරා, අංක 225/3, රාජගිරිය පාර රාජගිරිය ආර්. පී. කුලුප්පුආරච්චි, අංක 225/2, රාජගිරිය පාර, රාජගිරිය, එන්. එස්. කුලුප්පුආරච්චි, මිරිස්සගේ අනුර උපාලි ප්‍රනාන්දු, බූස්ටර් පොම්පාගාරයට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා අවශ්‍ය වී ඇත; ප්‍රමාණය: හෙක්. 0.0198.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 ඔක්තෝබර් මස 16 දින පෙ.ව. 10.00 ට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2025 සැප්තැම්බර් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**කසුන් ඇපා සෙනෙවිරත්න,**
ප්‍රාදේශීය ලේකම්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

2025 ජූලි මස 18 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

EOG 07 - 0258

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.